# කාර්ය සාධන වාර්තාව
# வருடாந்தச் செயலயாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT
# 2021

කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
**Ministry of Industries**

# 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## කර්මාන්ත අමාත්‍යාංශය

## වැය ශීර්ෂ අංකය:149

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

# පටුන


| | පිටුව |
| --- | --- |
| හැඳින්වීම | V |
| පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01-08 |
| පරිච්ඡේදය 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 09-20 |
| පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 21-42 |
| පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශකය | 43-46 |
| පරිච්ඡේදය 05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 47-50 |
| පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ | 51-56 |
| පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව | 57-68 |

# හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 මගින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය තුලින් අමාත්‍යාංශයේ ආයතනික පැතිකඩ සහ ක්‍රියාවට නැංවීමේ සාරාංශය දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු, කාර්යයන් සංවිධාන ව්‍යුහය, අමාත්‍යාංශය යටතේ පවතින අංශයන් සහ අමාත්‍යාංශය යටතට අයත් වන සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ ව්‍යාපෘති වලට අදාළ තොරතුරු සංක්ෂිප්තව ඇතුලත් කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින අංශ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ ව්‍යාපෘති මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් දෙවන පරිච්ඡේදය මගින් සවිස්තරාත්මකව දක්වා ඇත .

තුන්වන පරිච්ඡේදය මඟින් අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව තොරතුරුද අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධන දර්ශකයක් අනුව ලගා කරගෙන ඇති ප්‍රගතිය හතර වන පරිච්ඡේදය තුලින් සංක්ෂිප්තව දක්වා ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශය දක්වන ලද දායකත්වය පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව පස්වන පරිච්ඡේදය මඟින් දක්වා ඇත.

හයවන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ දක්වා ඇති අතර ඒ තුලින් අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව, ක්‍රියාත්මක කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳව තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත.

ඉහත චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘති පත්‍රය පරිදි ලබා ගැනීමට අපේක්ෂිත වූ කාර්ය සාධනය පිළිබඳව වූ අනුකූලතා වාර්තාව හත්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

" ගෝලීයව තරඟකාරී, තිරසර සහ සුවිශේෂී ශ්‍රී ලාංකීය නිෂ්පාදන කර්මාන්ත අංශයක් "

### මෙහෙවර

" තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළෙඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් තහවුරු කිරීම. "

### අරමුණු

- නිෂ්පාදන කර්මාන්ත අංශයේ සියළුම පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම උදෙසා හිතකර ව්‍යුහයක් ගොඩනැගීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයේ තාක්ෂණ භාවිතාවන්, අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය, දේශීය සම්පත් භාවිතය සහ තිරසර බව ඉහළ නැංවීම.
- සැමට ප්‍රතිලාභ සලසන කාර්මික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සහ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.
- කර්මාන්ත අංශයේ දේශීය සහ ගෝලීය වෙළෙඳපොල ප්‍රවේශය ඉහළ නැංවීම.

## 1.2. ප්‍රධාන කාර්යයන්

### කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයපථය

2020.10.06 දිනැති අංක 2187/27 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත අමාත්‍යාංශයට පවරා ඇති විෂය පථය පහත පරිදි වේ.

කර්මාන්ත විවිධාංගීකරණයක් හරහා දේශීය කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය තරඟකාරිත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය.

### කාර්යයන් හා කර්තව්‍යයන්

" සෞභාග්‍යයේ දැක්ම " ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දේශීය කර්මාන්ත ගොඩනැඟීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම " සඳහා අදාල රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය , ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු , රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

### සුවිශේෂී ප්‍රමුඛතා

(1) සියළුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරිමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(2) ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂම ඉටුකර ගැනීම සඳහා " තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක් " ස්ථාපනය කිරීම.

(3) අපනයන ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(4) පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත් ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.


(5) බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

(6) දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම.

(7) දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්තපුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබා දීම.

(8) දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදනය ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම.

## 1.3 ආයතනික ව්‍යුහය



## 1.4. අමාත්‍යාංශය යටතේ පවතින අංශ සහ ආයතන

### අංශය

01. ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය
02. කර්මාන්ත සංවර්ධන අංශය
03. සංවර්ධන අංශ I
04. සංවර්ධන අංශ II
05. සංවර්ධන අංශ III
06. කර්මාන්ත ලියාපදිංචි අංශය
07. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III - වක්‍රීය අරමුදල
08. ප්‍රතිව්‍යුහගතකරණ අංශය

### අධිකාරි, මණ්ඩල සහ කොමිෂන් සභා

01. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
02. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### රාජ්‍ය ව්‍යවසායයන්

01. කහටගහ ග්‍රැෆයිට්
02. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
03. ලංකා ඛනිජ වැලි සමාගම
04. මාන්තායි සෝල්ට් ලිමිටඩ්
05. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව
06. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
07. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම
08. අලිමංකඩ ලුණු ලේවාය
09. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය
10. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
11. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)
12. සීමාසහිත බී.බී.සී. සමාගම
13. සිමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම
14. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්
15. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රතිපත්ති සංවර්ධන අංශය

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කටයුතු සිදු කිරීම.
- 1990 අංක 46 දරන කාර්මික ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම අදහස් ලබා ගෙන ඇත.
- ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදනය, එකළස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (අනුවාදය 1.0) 2021.03.15 දින එළිදක්වන ලදි.
- ඒ යටතේ දැනට ලියාපදිංචි මුළු ආයතන ගණන 13 ක් වන අතර ප්‍රධාන වාහන මාදිලි 5 ක් (කාර්/ජීප්, භාණ්ඩ ප්‍රවාහන වාහන, මෝටර් බයිසිකල්, ඉලෙක්ට්‍රික් ත්‍රී වීල් සහ All-Terrain Vehicle ATV) යටතේ ලියාපදිංචි වාහන මාදිලි සංඛ්‍යාව 28කි.
- 30% ක දේශීය එකතුකළ අගය සහිතව, නිෂ්පාදනය කරන ලද විදුලි උපාංග (HS 84 හා 85 පරිච්ඡේද වලට අයත්) සඳහා නිෂ්පාදන බදු සහන ලබාදීම නිර්දේශ කිරීමේ කාර්යයන්ද අදාළ අනෙකුත් ආයතන සමඟ සිදුකරන ලදී.
- කර්මාන්ත අංශයන් සමඟ සාකච්ඡා පවත්වමින්, තීරු බදු සම්බන්ධ ගැටළු මුදල් අමාත්‍යාංශය හරහා විසඳීමට දායකත්වය දක්වන ලදී.

**ඉදිරි සැලසුම්**

- **2022** දී කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- වාහන නිෂ්පාදකයින් දේශීයව මෝටර් රථ එකලස් කිරීමේදී මුහුණ දුන් ගැටළු සහ ප්‍රායෝගික අත්දැකීම් හා මෝටර් රථ නිෂ්පාදකයින්ගේ අදහස් සමඟ වර්ෂ 2022 දී, සම්මත මෙහෙයුම් පටිපාටිය සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇත.
- ස්ථාවර තීරුබදු ව්‍යුහයක් සැකසීම සඳහා අඛණ්ඩව දායක වීමට අපේක්ෂා කෙරේ.
- දේශීය මෝටර් රථ නිෂ්පාදන සහ එකලස් කිරීමේ කර්මාන්තයේ මෙන්ම මෝටර් රථ උපාංග නිෂ්පාදනයේ නියැලීම සඳහා දේශීය සමාගම් සමඟ හවුල් ව්‍යාපාර ඇති කර ගැනීමට විදේශීය හා දේශීය ආයෝජන දිරිමත් කිරීම.

## 2.2 කර්මාන්ත සංවර්ධන අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- අමාත්‍යාංශය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 20 ක විදුලිය, ජලය සහ මාර්ග වැනි යටිතල පහසුකම් සහිත අක්කර 1,024.25 ක ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කර කර්මාන්තපුර 33 ක් ස්ථාපිත කර ඇත.
- එම කර්මාන්තපුර 33 හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් රු. මිලියන 3,980.05 පමණ වැය කර ඇති අතර ඊට අමතරව ඉහත සඳහන් කර්මාන්තපුරවල කර්මාන්තශාලා පිහිටුවීම සඳහා පෞද්ගලික අංශය විසින් රු. මිලියන 49,094.16 ක් වියදම් කර ඇත.
- කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ 2021 වර්ෂය තුල වාණිජ කටයුතු ආරම්භ කරන ලද ආයතන සංඛ්‍යාව 419 වන අතර රැකියා අවස්ථා 22,807 ක් මෙමගින් බිහි කොට ඇත.
- 2021 වර්ෂය තුළ පවතින කර්මාන්තපුර වලින් ඉඩම් කොටස් 96 ක් ආයෝජකයන් සඳහා ලබා දි ඇති අතර ඉන් කර්මාන්ත 70 ක් ආරම්භ කිරීමට අදාළව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවති.
- රයිගම කර්මාන්තපුරයේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වැඩකටයුතු 95% ක් අවසන් කර ඇත.
- රත්මලාන කර්මාන්තපුරයේ ඇළ මාර්ගය ඉදිකිරීම් කටයුතු නිම කර ඇත.
- ටෙම්පල්බර්ග් කර්මාන්තපුරයේ වැසි ජලය බැසයාමේ කාණු පද්ධතිය ඉදිකිරීම අවසන් කර ඇත.
- උලපනේ කර්මාන්තපුරයේ කාණු පද්ධතිය ඉදිකිරීම සහ අතුරු මාර්ග සංවර්ධනය කර ඇත.
- බටඅත කර්මාන්තපුරයේ ආරක්ෂිත වැට ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත
- නාලන්ද එල්ලාවල අදියර I කර්මාන්තපුරයේ ආරක්ෂිත වැට අළුත්වැඩියාව නිම කර ඇත.
- බුත්තල කර්මාන්තපුරයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම අවසන් කර ඇත.
- ඇඹිලිපිටිය කර්මාන්තපුරයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත.
- එරාවූර් කර්මාන්ත කලාපයේ -
  - අප ජලය මුහුදට බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 80 % ක් නිම කර ඇත.
  - විදුලිබලය ලබා දීමේ කටයුතු 65% ක් අවසන් කර ඇත.
  - පිවිසුම් මාර්ග සංවර්ධනය 60% ක් නිම කර ඇත.

**ඉදිරි සැලසුම්**

- කර්මාන්තපුර වල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම. (මිල්ලෑව, කරන්දෙණිය ,ඌව පරණගම, දංකොටුව, රයිගම, බුත්තල, නාලන්ද එල්ලාවල )
- කටුනායක, පාලින්ද නුවර හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශ වල නව කර්මාන්තපුරයන් ඉදිකිරිමට අපේක්ෂිතයි.
- 2022 අයවැය යෝජනා වලට අනුව 2022 වර්ෂයේ නව කර්මාන්තපුර ස්ථාපිත කිරිම සඳහා රු.මිලියන 5000 ක වියදමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එක් කර්මාන්තපුරයක් ස්ථාපිත කිරීම යන වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තපුර 40 ක් ස්ථාපිත කිරිමට අපේක්ෂිත වන අතර පළමු අදියර ලෙස කර්මාන්තපුර 20 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරිමට නියමිතයි.

## 2.3 ආංශික සංවර්ධන අංශ

**සංවර්ධන අංශ I**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ පද්ධති සහතික ලබා ගැනීම සඳහා සැකසූ ආහාර, ඇසුරුම්, තේ, කොහුබත් සහ කුළුබඩු අංශයේ කර්මාන්තවල කාර්මික ඵලදායිතාව, වෙළඳපල තරඟකාරිත්වය සහ තිරසාර බව වැඩිදියුණු කිරීමේ වැඩසටහන (ISO 9001, ISO 140001, ISO 22000, ISO 50001) යටතේ සාර්ථකව නිම කළ කර්මාන්ත සංඛ්‍යාව 58කි.
- ආහාර රසායනාගාරයේ (Accredited Food Laboratory) රසායනික විද්‍යාගාරයෙන් කර්මාන්ත විසින් ඉදිරිපත් කරන ලද ආහාර නිෂ්පාදන සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර වාර්තා 475 පමණ නිකුත් කර ඇත.
- ලංකා පැක් ප්‍රදර්ශනය (Lanka Pak Exhibition - 2021) සාර්ථකව පවත්වන ලදි.

**ඉදිරි සැලසුම්**

- දේශිය වශයෙන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුලින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශිය වෙළඳපොල සකස් කර ගැනීමට සහය වීම.
- භාණ්ඩ අපනයනය දිරිමත් කිරිමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තිරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- කර්මානතකරුවන් මුහුණ දෙන ගැටළු පිළබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයන්ගේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සේවා නියුක්ත ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දේශිය හා විදේශිය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොල තරඟකාරීත්වය සහ තිරසාරත්වය ඉහළ නැංවීම තුලින් අදායම් හා රැකියා උත්පාදන හැකියාව ඉහළ යාම හා එම කර්මාන්ත වල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ආහාර සුරක්ෂිතතාව සහ කර්මාන්තවල නිෂ්පාදන ගුණාත්මකභාව වැඩිදියුණු කිරීම සඳහා තත්ව සහතික වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- නැවත ප්‍රතිස්ථාපනය කරන ලද උපදේශන කමිටු යෝජනා හා අදහස් පදනම් කර ගනිමින් ඒ ඒ අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**සංවර්ධන අංශ II**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- ශ්‍රී ලංකාවේ වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ, සංවර්ධන සහ නියාමන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වූ කැබිනට් පත්‍රිකාව අනුමැතිය ලැබීම.

**ඉදිරි සැලසුම්**

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය හා මෝටර් රථ එකලස් කිරිම හා උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.
- දේශිය මැටි සෙවිලි උළු නිෂ්පාදනයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා දීමට කටයුතු කිරීම.
- බෝට්ටු හා බෝට්ටු ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ප්‍රදර්ශනයක් 2022 දී කොළඹ Port City හිදී පැවැත්වීමටත් එවැනි ජාත්‍යාන්තර ප්‍රදර්ශන වලට කරුමාන්තකරුවන් සහභාගි කිරීමටත් අපේක්ෂිතයි.
- අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කරන ලද බෝට්ටු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය සඳහා වූ නියාමන රාමුවට අනුව (Regulatory Frame Work) බෝට්ටු යාත්‍රාංගන ලියාපදිංචි කිරීමට අපේක්ෂා කෙරේ.
- දේශිය මෝටර්රථ අමතර කොටස් නිෂ්පාදන සඳහා ජාත්‍යාන්තර ප්‍රමිති සහතික ලබා ගැනිමට කටයුතු කිරීම

**සංවර්ධන අංශ III**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- හදුන්කූරු සඳහා අවශ්‍ය උණ කූරු රට තුලින්ම සපයා ගැනීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස GIS තාක්ෂණය යොදා ගනිමින් හදුන්කූරු සඳහා අවශ්‍ය උණ වගාකර ඇති ප්‍රදේශයක් ලෙස මහවැලි ගඟ ආශ්‍රිත ස්ථාන හදුනා ගෙන ඇත.
- කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 7 ක් තුල ගෘහාශ්‍රිත පාවහන් නිෂ්පාදය සම්බන්ධ නව ව්‍යවසායකින් බිහි කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වා මෙවලම් කට්ටල සහ අමුද්‍රව්‍ය ලබාදීම.
- වසරේ විශිෂ්ඨතම කර්මාන්තකරුවන් ඇගයීමේ සම්මාන උළෙළ පැවැත්වීම.
- දේශිය කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ට උපකාර කරනු පිණිස අබලි ලෝහ භාවිතා කිරිම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයෙහි අනුමැතිය ලබාදි ඇති අබලි ලෝහ වර්ග හැර අනෙක් අබලි ලෝහ අපනයනය තහනම් කර ඒ ආශ්‍රිත කර්මාන්ත රට තුල ඇති කිරීම.

**ඉදිරි සැලසුම්**

- ලෝහ ආශ්‍රිත කර්මාන්ත වල අගය එකතු කිරීම ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හදුන්කූරු නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් යොදා ගන්නා විශේෂිත උණ බට කූරු සපයා ගැනීම හා හදුන්කූරු නිෂ්පාදනය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියට උණ බටකූරු අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම රට තුල නිෂ්පාදනය කිරීමට අපේක්ෂිතය.
- සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්තයන්හි නියැලෙන්නන්ගේ තාක්ෂණික දැනුම ඉහල නැංවීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර වෙළෙඳපලට පිවිසීම අරමුණු කරගනිමින් කර්මාන්ත නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීමට අවශ්‍ය වැඩ සටහන් සහ පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.
- කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යන්තර කර්මාන්ත හා වෙළෙඳ ප්‍රදර්ශන වලට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.

**කර්මාන්ත ලියාපදිංචි අංශය**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- කර්මාන්ත ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණය වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව 2021.04.28 දින සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන් ඔස්සේ පුවත්පත් දැන්වීම් පළ කරන ලදී.
- 2021 වසර තුල මෙම අමාත්‍යාංශය යටතේ කර්මාන්ත 242 ක් ලියාපදිංචි කර ඇත.

**ඉදිරි සැලසුම්**

- ස්වයංක්‍රීයකරණය කරන ලද කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් (Automation of Industrial Registration Process) හඳුන්වාදී මාර්ගගත ක්‍රමය ඔස්සේ කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම හා පුළුල් දත්ත කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම අපේක්ෂිතයි.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා මාධ්‍ය හරහා කර්මාන්ත ලියාපදිංචිය පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම
- ලියාපදිංචි නොවූ කර්මාන්තකරුවන් සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම.

## 2.4 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන නව ව්‍යාපෘති

**කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SMILE III)**

**ප්‍රගතිය/ජයග්‍රහණ**

මෙම අරමුදලෙන් නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාරවල ඵලදායිතාව වර්ධනය කිරීම, එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණාත්වය වර්ධනය කිරීම සඳහා අඩුපොලී අනුපාත යටතේ ණය ලබාදෙයි. එමෙන්ම මෙම ණය යෝජනා ක්‍රමයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදන වල වර්ධනයක් ඇති කිරීම සඳහාද ණය ලබාදෙයි. මෙම ණය යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2012 වසරේ මැයි 01 දින සිට ඉහත අරමුණු සඳහා ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත කාලය පරිච්ඡේදය තුල ව්‍යාපෘති කළමනාකරණ ඒකකය උප ව්‍යාපෘති 142 කට රුපියල් මිලියන 1,024 මුදා හරින ලදි.

- වසරට කළ වෙන් කිරීම - රුපියල් මිලියන 1,050
- වියදම- රුපියල් මිලියන 1,024

**පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E-Friend II)**

**ප්‍රගතිය/ජයග්‍රහණ**

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් ලබා දෙයි. එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මුල්‍ය සහාය ලබා දෙනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2018 සිට ඉහත අරමුණු සඳහා ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත කාලය තුල ව්‍යාපෘති කළමනාකරණ ඒකකය උපව්‍යාපෘති 17 සඳහා රුපියල් මිලියන 200.9 මුදාහරින ලදි.

- වසරට කල වෙන් කිරීම - රුපියල් මිලියන 250
- වියදම - රුපියල් මිලියන 200.9

**ඉදිරි සැලසුම්**

- ඉදිරි වසරේදී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 90 කට මුදල් ලබා දී නව රැකියා අවස්ථා 200 ජනිත කිරීම
- E- Friend II යටතේ ව්‍යාපෘති 32 කට 2022 වසරේ මුදල් ලබා දීමට අපේක්ෂා කරයි.

# 2.5 රාජ්‍ය ව්‍යවසායන්

## 2.5.1 කාර්මික සංවර්ධන මණ්ඩලය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- කර්මාන්තකරුවන් වෙත පහසුකම් සැලසීමේ සුහුරු ක්‍රමවේදය (Smart One Stop Shop) අනුව ස්ථාපනය කළ පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් හම්බන්තොට වරාය පරිශ්‍රයේදී විවෘත කිරීම.
- ඉංජිනේරු වාත්තු අංශයේ අළුතින් ස්ථාපනය කරන ලද Medium Frequency Induction Furnace විදුලි උණුකිරීම් උඳුන් වල නිළ වශයෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.
- පන්නල කාර්මික ජනපදයේ II අදියරේ ආරම්භ කරන පළමු කර්මාන්තය ලෙස අශොක් මැෂිනරි (පුද්ගලික) සමාගමේ මුල්ගල් තැබීම සිදු කිරීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලය, නවීන කුළු බඩු සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කර දීම සඳහා උපදේශන සේවාවන් සැපයීම වෙනුවෙන් කුඩා වැවිලි බෝග වගා සංවර්ධන කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් වැඩසටහන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මගපෙන්වීම හා උපදේශකත්වය යටතේ ක්‍රියාත්මක කිරීම

**වෙනත් ව්‍යාපෘති/ වැඩසටහන් වල ප්‍රගතිය**

- UNIDO මූල්‍ය දායකත්වයෙන්උණ බට ආශ්‍රිත නිෂ්පාදන පුහුණු හා සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- වාත්තු පහසුකම් මධ්‍යස්ථානය නවීන යන්ත්‍ර උපකරණ යොදා වැඩිදියුණු කිරීම සහ සේවා කටයුතු කාර්යක්ෂම කිරීම (Induction Furner යන්ත්‍රයක් සවිකිරීම).
- වසර ගණනාවක් තුළ ගැටළුවක්ව පැවති පානළුව කාර්මික ජනපද භූමිය අත්පත් කරගැනීම.
- ලක්කම් අලෙවි මධ්‍යස්ථානය තුළ සම්භාණ්ඩ නිෂ්පාදන ප්‍රදර්ශනාගාරයක් ඇතිකිරීම සහ දියත උයනෙහි සම්භාණ්ඩ නිෂ්පාදන ප්‍රදර්ශන සහ අලෙවි පොළවල් පැවැත්වීම.
- කොවිඩ් 19 හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය වීම සඳහා ගම්පහ, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මාතර, ගාල්ල යන ස්ථානවල වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්විණි.
- සුළු, කුඩා සහ මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන් සඳහා කර්මාන්ත නාමාවලියක් සැකසීමේ පළමු අදියර අවසන් කිරීම.
- මූල්‍ය හා පරිපාලන ක්‍රියාවලින් වඩාත් කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාම සඳහා Enterprise Resource Planning- ERP) පද්ධතියක් සැකසීම.
- මණ්ඩලයීය සුපරීක්ෂණය සහ අනුමැතිය යටතේ ලෝහමය අපද්‍රව්‍ය අපනයනය කිරීමට දේශීය ලෝහ ආශ්‍රිත නිෂ්පාදකයන්ට සහායවීම.
- මහජන බැංකුව සමඟ දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ලෝහ අමුද්‍රව්‍ය සැපයීම මගින් දේශීය ලෝහ මත පදනම් වූ නිෂ්පාදකයින් 250 දෙනෙකුට සහාය වීම.
- වසංගත තත්ත්වය තුළ කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන වෙබ් හරහා අලෙවි කිරීම සඳහා සහාය වීමට මාර්ගගත පුහුණු පහසුකම් ලබා දීම.

**ඉදිරි සැලැසුම්**

- බොයිලේරු සහ අධිපීඩන උපාංග නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය නිෂ්පාදන, පර්යේෂණ අත්හදා බැලීම් සහ සහතිකකරණ මධ්‍යස්ථානය.
- IDB හි කාර්මික ජනපදවල යටිතල පහසුකම් සක්‍රිය කිරීම සහ නවීකරණය කිරීම මගින් නව කර්මාන්ත වල නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.
- ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුල පර්යේෂණ සහ සංවර්ධන සංස්කෘතියක් ගොඩනැගීම - ආහාර පදනම් කරගත් නියමු ව්‍යාපෘතිය.
- කාබනික සහතිකය ලබා ගැනීම සඳහා කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

## 2.5.2 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන්ගේ අලෙවි ප්‍රවර්ධනය හා පහසුකම් සැපයීම සඳහා Made in Sri Lanka වෙළඳ ද්වාරය ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
- ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ දත්ත පද්ධතිය, අධිකාරිය මගින් සකස් කර යාවත්කාලීන කිරිමට පියවර ගැනීම.
- “Made in Sri Lanka” සන්නාමය ව්‍යවසායකයන් 37 කට පිරිනමා ඇත.
- “Made in Sri Lanka” වෙළඳ සල්පිල් දෙකක් කොළඹ දිස්ත්‍රික්කයේ ද එකක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීය.
- උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය වැඩසටහන යටතේ උපාධිධාරීන් 200 ක් පමණ ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කර ඇත.
- ප්‍රාදේශීය ව්‍යවසාය සම්මාන ප්‍රදාන උත්සව බස්නාහිර,උතුරු මැද, සබරගමුව,දකුණ සහ මධ්‍යම යන පළාත්වල පැවැත්විය.
- ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකයින් 4,759 කට පුහුණුව ලබා දීම.

**ඉදිරි සැලසුම්**

- ප්‍රධාන ආහාරයට ආදේශකයක් ලෙස හා විවිධාංගීකරණය වූ අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස කොස් ප්‍රවර්ධන වැඩසටහන වෙළෙඳ පොළට හඳුන්වා දීමට අපේක්ෂා කරයි.
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය හා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සමුපකාර සමිතියක් පිහිටුවීමට අධිකාරිය සැලසුම් කරමින් සිටියි.
- දේශීය නිෂ්පාදන ප්‍රදර්ශන කළ හැකි පරිදි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට නව කාර්යාල පරිශ්‍රයක් ස්ථාපනය කිරිමට අපේක්ෂිතයි.
- මධ්‍යම පළාතේ නව තාක්ෂණික පෙරවැඩුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

### 2.5.3 මාන්තායි ලුණු සමාගම

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- මන්නාරම ලේවායෙහි අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය ප්‍රසම්පාදන ක්‍රියාවලියට යොමු කර ඇත.

**ඉදිරි සැලසුම්**

- මේස ලුණු නිෂ්පාදනාගාරය අලිමංකඩ ලුණු ලේවායේ ස්ථාපිත කිරීම.

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

**ඒසීඒ- ඒෆ්**

# 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2021 රු. | | සටහන | තත්‍ය 2021 | තත්‍ය 2020 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,623,229,810.48 | 3,075,414,190.40 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 23,753,162.29 | 17,944,099.92 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 25,008,560.48 | 45,298,859.09 | ඒසීඒ-5 /5(ඒ) |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | 30,587,124.41 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,671,991,533.25** | **3,169,244,273.82** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,671,991,533.25** | **3,169,244,273.82** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඈ) | | 963,940.98 | | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 2,671,027,592.27 | 3,169,244,273.82 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 452,560,200.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 378,958,652.28 | 422,404,223.20 | ඒසීඒ- 2(ii) |
| 141,276,800.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 103,886,661.57 | 223,041,449.90 | |
| 543,340,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 509,394,781.22 | 429,423,324.94 | |
| | පොළී ගෙවීම් | 8 | | | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | |
| **1,137,177,000.00** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **992,240,095.07** | **1,074,868,998.04** | |
| | **මූලධන වියදම්** | | | | |
| 42,100,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 18,831,340.57 | 15,340,413.65 | |
| 14,435,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 12,788,432.12 | 11,256,466.58 | |
| 328,000,000.00 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1 42,454,677.91 | 292,814,291.14 | ඒසීඒ -2(ii) |
| 1,440,000,000.00 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 1,225,563,567.98 | 1,684,194,605.40 | |
| 3,800,000.00 | හැකියා වර්ධනය | 14 | 1,236,045.00 | 2,132,136.18 | |
| 1,309,850,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 833,991,911.69 | 824,025,818.66 | |
| **3,138,185,000.00** | **මුළු මූලධන වියදම් (උ)** | | **2,234,865,975.27** | **2,829,763,731.61** | |
| | **තැන්පතු ගෙවීම්** | | 25,241,896.35 | 21,027,012.71 | |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 18,140,192.21 | 27,597,006.76 | ඒසීඒ-4 |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 43,382,088.56 | 48,624,019.47 | ඒසීඒ- 5/5(ඒ) |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **3,270,488,158.90** | **3,953,256,749.12** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ= (ඉ-එ)** | | **(599,460,566.63)** | **(784,012,475.30)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(605,465,298.13)** | **-** | ඒසීඒ-7 |
| | **2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **6,004,731.50** | | ඒසීඒ-3 |
| | | | **(599,460,566.63)** | | |

ඒසීඒ-පී

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,703,475,097.33 | 1,671,411,553.63 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 56,333,663.28 | 63,202,031.55 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 6,004,731.50 | - |
| මුළු වත්කම් | | 1,765,813,492.11 | 1,734,613,585.18 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (9,591,766.36) | (4,212,132.15) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,703,475,097.33 | 1,671,411,553.63 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 65,925,429.64 | 67,414,163.70 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 6,004,731.50 | - |
| මුළු වගකීම් | | 1,765,813,492.11 | 1,734,613,585.18 |

පිටු අංක......7......සිට ......46.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..47... සිට ..48... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : 2022.02.28 | තනතුර : | දිනය : 2022.02.25 |
| | දිනය : 2022.02.28 | |
| ජෙනරාල් දයා රත්නායක<br>ලේකම්<br>කර්මාන්ත අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. | ජෙනරාල් දයා රත්නායක<br>ලේකම්<br>කර්මාන්ත අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. | එස්.එච්. ප්‍රනාන්දු<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි<br>කර්මාන්ත අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. |

**ඒසීඒ-සී**

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතය | |
|---|---|---|
| | **2021 (රු.)** | **2020 (රු.)** |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| | | - |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 33,420,559.22 | |
| අග්‍රිම ලැබීම් | 2,623,229,810.48 | 3,096,899,554.81 |
| අත්තිකාරම් අයකර ගැනීම | 22,675,628.07 | |
| තැන්පතු ලැබීම් | 23,753,162.29 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,703,079,160.06** | **3,096,899,554.81** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 482,665,123,.85 | 418,513,920.29 |
| සහනාධාර සහ මාරුකිරීම් | 15,187,659.22 | 21,848,986.44 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | (410,372.23) | 44,772,970.80 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 963,940.98 | |
| අත්තිකාරම් ගෙවීම් | 19,507,893.39 | |
| තැන්පතු ගෙවීම් | 19,529,567.35 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **537,443,812.56** | **485,135,877.53** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,165,635,347.50** | **2,611,763,677.28** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 9,101,760.00 |
| උපණය අයකර ගැනීම් | | |
| අත්තිකාරම් අයකර ගැනීම | | 14,092,538.46 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | 23,194,298.46 |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 2,159,630,616.00 | 2,635,071,314.17 |
| අත්තිකාරම් ගෙවීම | | 5,996,050.00 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,159,630,616.00** | **2,641,067,364.17** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(2,159,630,616.00)** | **(2,617,873,065.71)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **6,004,731.50** | **(6,109,388.43)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | | 13,108,205.38 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **13,108,205.38** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | | 6,998,816.95 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **6,998,816.95** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **6,109,388.43** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | **6,004,731.50** | **0.00** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **0.00** | **0.0** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **6,004,731.50** | **0.00** |

ඒසීඒ - 2

# 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

**වියදම් ශීර්ෂ අංකය : 149**

**අමාත්‍යාංශයේ නම : කර්මාන්ත අමාත්‍යාංශය**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය :149

අමාත්‍යාංශයේ නම : කර්මාන්ත අමාත්‍යාංශය

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 464,362,000.00 | - | (8,235,000.00) | 456,127,000.00 | 352,526,782.31 | 103,600,217.69 |
| | (2) ප්‍රාග්ධන | 34,400,000.00 | 10,500,000.00 | 4,235,000.00 | 49,135,000.00 | 26,545,358.27 | 22,589,641.73 |
| | උප එකතුව | 498,762,000.00 | 10,500,000.00 | (4,000,000.00) | 505,262,000.00 | 379,072,140.58 | 126,189,859.42 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 677,050,000.00 | - | 4,000,000.00 | 681,050,000.00 | 639,713,312.76 | 41,336,687.24 |
| | (2) ප්‍රාග්ධන | 2,389,200,000.00 | 699,850,000.00 | - | 3,089,050,000.00 | 2,208,320,617.00 | 880,729,383.00 |
| | උප එකතුව | 3,066,250,000.00 | 699,850,000.00 | 4,000,000.00 | 3,770,100,000.00 | 2,848,033,929.76 | 922,066,070.24 |
| | මුළු එකතුව | 3,565,012,000.00 | 710,350,000.00 | - | 4,275,362,000.00 | 3,227,106,070.34 | 1,048,255,929.66 |

.....................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2022. 02. 25

එස්.එච්. ප්‍රනාන්දු
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

# 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තා කිරීමේ පදනම**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කල මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනියි.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**7. මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදු කරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදු කර ඇත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාල නැත

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු.) | අවසාන ප්‍රතිපාදනය (රු.) | | |
| පුනරාවර්තන | 1,141,412,000 | 1,137,177,000 | 992,240,095 | 87.25% |
| ප්‍රාග්ධන | 2,423,600,000 | 3,138,185,000 | 2,234,865,975 | 71.22% |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන: අදාල නැත**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු. | 31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු. | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 74,200,000.00 | 74,200,000.00 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 577,775,097.33 | 577,775,097.33 | - | 100% |
| 9153 | ඉඩම් | 1,051,500,000.00 | 1,051,500,000.00 | - | 100% |

## 3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | IMT/A/MOI/FA/2021/05 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2022 මැයි 24 දින |

කර්මාන්ත අමාත්‍යාංශය
25 MAY 2022
05/152
මුදල් අංශය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

කර්මාන්ත අමාත්‍යාංශය

**කර්මාන්ත අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ජේ. විජේකෝන්

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : - ලේකම් - මුදල් අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/A/MOI/FA/2021/05 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 24 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කර්මාන්ත අමාත්‍යාංශය

**කර්මාන්ත අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කර්මාන්ත අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව කාර්යාලීය උපකරණ හා ප්‍රවාහන උපකරණ වල වටිනාකම පිළිවෙලින් රු.65,612,794ක් හා රු.480,098,759ක් විය. 2021 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඒවායේ ආරම්භක ශේෂ වටිනාකම පිළිවෙලින් රු.81,862,905ක් හා රු.483,123,759ක් වූයෙන් රු.19,275,111ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති රු.52,290,000ක වටිනාකමැති වාහන 4ක් වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් අමාත්‍යාංශයක් වෙත පවරා දී ඇති අගය රු.12,000,000 ක් වූ වාහනය කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කම් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) කර්මාන්ත අමාත්‍යාංශය නමින් ලියාපදිංචිව ඇති තාවකාලික පදනමින් වෙනත් අමාත්‍යාංශ වෙත ලබා දී ඇති මෝටර් රථ 3 ක වටිනාකම වන රු. 15,550,000ක ප්‍රමාණය කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) විවිධ අමාත්‍යාංශ වලින් රු. 20,100,000 ක වටිනාකමැති වාහන 09 ක් කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලැබී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එම වාහන ලියාපදිංචි අමාත්‍යාංශ අහෝසි කර තිබුණි. එම වාහන අමාත්‍යාංශය විසින් භාවිතා කළද ඒවායේ වටිනාකම කිසිම ස්ථානයක ගිණුම් ගත වී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) අමාත්‍යාංශ පුස්තකාලයෙහි පවතින පොත් වටිනාකම අගය කර වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(උ) අමාත්‍යාංශය විසින් වැයදරා ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතු වුවත් 1997 වර්ෂයේ සිට කර්මාන්තපුර 30ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 14ක වටිනාකම වූ රු.මිලියන105.878ක ප්‍රමාණය කිසිදු කාර්යාලයක ප්‍රාග්ධනිත කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු පරික්ෂාවේදී එය නිසි පරිදි සකස් නොකිරීම නිසා වැය ශීර්ෂ 25 ක් යටතේ සලසන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 100ක පරාසයක ඉතිරි වීම් පැවතිණි.

(ආ) 149-1-1-0-2003 වැය ශිර්ෂය සඳහා රු.1,200,000ක් වර්ෂය තුල වෙන්කර තිබියදී තවත් රු.10,500,000ක් පරිපූරක ලෙස ලබාගෙන තිබුණු අතර ඒ අනුව එහි මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.11,700,000 ක් විය. එසේ වුවද, වර්ෂය අවසාන වන විට ඉන් රු.10,581,045ක් ඉතිරි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 90ක් විය. නිසි පරිදි වියදම් ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ඇස්තමේන්තුවේ දී වෙන් කරන ලද මුදලවත් වියදම් කර නොතිබිය දී අමාත්‍ය කාර්යය මණ්ඩලයේ වාහන සඳහා තවත් රු.10,500,000ක පරිපූරක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි.

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | |
|---|---|
| මු.රෙ . 110 | සමාලෝචිත වර්ෂයේදී අලාභ හානි ලේඛනයක් ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| මු.රෙ. 396 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු.617,007ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

චක්‍රලේඛ
----------

| | |
|---|---|
| (අ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් හෝ එන්ජිමට සම්බන්ධ අළුත්වැඩියාවකට පසුව හෝ යන |

| | |
|---|---|
| | කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වේ. එසේ වුවද අමාත්‍යාංශයට අයත් වාහන 71කින් වාහන 11ක පමණක් 2021 වර්ෂයට අදාලව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර තිබුණ ද වාහන 60කට අදාලව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ආ) අංක සී ඒ/1/17/1/ හා 2010 මැයි 14 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයෙහි 3.1 වගන්තිය | ගරු අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03ක් විය යුතු බව සඳහන් වුවද කර්මාන්ත අමාත්‍යාංශයේ අමාත්‍යවරයාට අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ වාහන 3 ට අමතරව, ලංකා මිනරල් සෑන්ඩ් සමාගමේ PK-5595 දරණ ඩබල් කැබ් රථය 2021 මාර්තු මස සිට භාවිතා කර තිබුණි. කැබ් රථයට 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් ආදායම් බලපත්‍ර සඳහා රු.18,000ක් ද දුම් සහතිකය සඳහා රු.2,260 ක්ද 2021 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා රියදුරු හට වැටුප් හා අතිකාල වශයෙන් රු.1,138,140ක්ද ලංකා මිනරල් සෑන්ඩ් සමාගමෙන් ගෙවීම් කර තිබුණි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

### 3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සංවර්ධන අංශ 4ක් ස්ථාපිත කර ඇති අතර, ඒවායේ කාර්යසාධනය පරීක්ෂාවේ දි පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** ජාත්‍යන්තර වෙළඳපලේ තරඟකාරිත්වයට මුහුණ දියහැකි ගුණාත්මක තත්ත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හා දේශීය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම යන අරමුණින් සංවර්ධන අංශ I පිහිටුවා තිබුණි. එහි කාර්යසාධනය පරීක්ෂාවේදී සැලැස්ම තුල ඇතුලත් කර තිබූ වැඩසටහන් 06 කින් 03ක ප්‍රගතිය 0ක් විය.

**(ආ)** දේශීය කර්මාන්ත අංශයන් ශක්තිමත් කිරිම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමඟින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මකභාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහි කරමින් ජාත්‍යන්තර වෙළඳපොල ජය ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණ කිරීමේ අරමුණින් සංවර්ධන අංශ II පිහිටුවා ඇති අතර එහි කාර්යසාධනය පරීක්ෂාවේදී සැලැස්ම තුල ඇතුලත් කර තිබූ වැඩසටහන් 03 හිම ප්‍රගතිය 0ක් විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර 33 හි ඇති ඉඩම් කට්ටි 1001කින් ඉඩම් කට්ටි 791ක් විවිධ ආයෝජන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට ලබා දී තිබූ අතර ඉඩම් කට්ටි 78 ක් එනම් පර්චස් 4968.2ක් නිශ්කාර්යව පැවතිණි. මධ්‍යම පළාතේ නාලන්ද කර්මාන්තපුරයේ මුළු බිම් කට්ටි 38 න් 08ක් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ සිට කර්මාන්ත පවත්වාගෙන යන අතර උතුරු පළාතේ ඉඩම් කට්ටි 31න් 8ක් පමණක් කර්මාන්තකරුවන්ට ලබා දී තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය සතු වාහන 5 ක් වර්ෂ 1 - 4 අතර කාල පරාසයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව අමාත්‍යාංශ භූමියේ රඳවා තිබුණි. මෙම වාහන 5 තුල 2013, 2014 වර්ෂවල මිලදී ගත් මෝටර් රථ 02 ක්ද ඇතුලත් විය. එසේම අපහරණය කළ යුතු මට්ටමේ පවතින වාහනයක්ද 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 13.2 වගන්තිය අනුව හා මු.රෙ.770 (4) ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 03කට වැඩි කාලයක සිට අළුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජ වලට යොමුකර තිබූ වාහන 03ක් 2022 මර්තු 15 වන විටත් අළුත්වැඩියාවන් සිදු කර ධාවනයට එක්කර නොතිබුණි.

(ඇ) දකුණු පළාතේ බටඅත කර්මාන්තපුරයේ ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකිව අබලන් තත්ත්වයේ පැවතිණි.

### 3.3 බැඳීම් හා බැරකම්

2022 ජනවාරි හා පෙබරවාරි වවුචර් පරීක්ෂාවේ දී 2021 වර්ෂය වෙනුවෙන් බැඳීම් සහ බැරකම් රු.1,932,762ක් හා SA- 92 භාණ්ඩාගාර මුද්‍රිතය අනුව බැරකම් රු.9,981,985ක්ද පැවතිණි. එසේ වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දී දරන ලද ඉහත බැඳීම් ඇතුලත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයක් 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 පාඩු හා හානි

කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව නිති අංශයේ ඇතැම් අයිතම් වල තථ්‍ය ශේෂය හා ලෙජරය අනුව ශේෂයේ වෙනස්කම් පැවති අතර 2020 හා 2021 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව දකුණ, ඌව-බදුල්ල හා සබරගමුව ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වල 2020 වර්ෂයේ සිට පැවත එන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 2021 වර්ෂයේදීද එලෙසම පවතින බවත් ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

(අ) ජපානයෙන් ගෙන්වන ලද වාහන කොටස් එකලස් කිරීමේ කටයුතු සඳහා මීනුවන්ගොඩ කර්මාන්තපුරයෙන් අක්කර 2ක භූමි ප්‍රමාණයක් 2002 ජුනි 11 දින පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. අමාත්‍යාංශයේ අක්‍රීය හා ඌන උපයෝජන සහිත ව්‍යාපෘති වාර්තා වලට අනුව එහි රු.මිලියන 500 ක ආයෝජනයක් හා රැකියා අවස්ථා 100 ක් ජනිත කිරීමට එකඟ වී තිබුණි. ඒසේ වුවද වසර 9කට ආසන්න කාලයක් තිස්සේ මෙහි ව්‍යාපාර කටයුතු නවතා දමා තිබුණු අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මෙම ආයතනයට බදු ඔප්පුවක් ලබාදී නොමැති බැවින් විශාල බදු මුදලක් ගෙවීමට ඇති බවද අනාවරණය විය. ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී මෙම ස්ථානයේ වාහන එකලස් කිරීම සිදුකරමින් නොපැවති අතර වර්ග අඩි 3000ක පමණ ගොඩනැගිලි 2ක් නිශ්කාර්යව පැවතිණි. මෙසේ විශාල ඉඩමක් ඵලදායි නිෂ්පාදන කටයුත්තකට ලබා නොදීමෙන් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් හා රජයේ ආදායමට බැර විය යුතු විශාල ආදායමක්ද අහිමි වී ගොස් තිබුණි.

(ආ) මීනුවන්ගොඩ කර්මාන්තපුරයේ පර්චස් 29කින් සමන්විත බිම් කට්ටියක පොදු පහසුකම් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීමට තීරණය කර තිබුණද පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීමට හෝ කිසිදු ව්‍යාපාරික කටයුත්තකට බෙදා දීමට හෝ මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) වානේ සහ දැවමය නිවාස සහ කාර්යාලීය ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා මහර කර්මාන්තපුරයේ පර්චස් 49.5 කින් යුත් කැබලි අංක 06 බිම් කට්ටිය 2007 ජනවාරි 19 දින මෙට්ල්වුඩ් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම වෙත ලබා දී තිබුණු අතර විගණනය විසින් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ව්‍යාපෘති වාර්තාවේ ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුරූපී ව්‍යාපාර කටයුතු සිදු නොවන බවත් සේවකයින් 100 වෙනුවට තිදෙනෙකු පමණ ව්‍යාපාර කටයුතු වල යෙදෙන බවත්, ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොකෙරෙන බවත් මහර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 27 දිනැති ම/ඉ/2/5-4 ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය පරිදි 2007 වසරේ සිට මෙම ආයතනය බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බවත් අණාවරණය විය.

(ඈ) අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය **(CERA)** ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 120 ක් පමණ වැය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා කාලයට මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද සමාගමක් වශයෙන් ලියාපදිංචි කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරණ ගැසට් පත්‍රය මඟින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි.

ඉන් පසුව මෙම ව්‍යාපෘතිය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස පිහිටුවීමටත්, කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමටත් 2020 දෙසැම්බර් 01 දිනැති අමප/20/1725/320/025 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද හිටපු කර්මාන්ත අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේ වුවද 2017 වර්ෂයේ සිට 2022 අප්‍රේල් අවසන් වන විටත් එනම් වර්ෂ 05 කට අධික කාලයක සිට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල නව බිම ගොඩනැගිල්ලේ මෙම උපකරණ නිශ්කාර්යව සමහර භාණ්ඩ මළ බැඳෙමින් පැවතිණි. ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම රොබෝ තාක්ෂණය සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණද මෙතෙක් එය ඉටුකර නොතිබුණි.

(ඉ) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III යටතේ සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය හා තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමය වශයෙන් උප ව්‍යාපෘති 2ක් සඳහා ණය පහසුකම් සැලසිය යුතු වුවත් සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය මත පමණක් ණය පහසුකම් ලබා දී තිබුණි.

(ඊ) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III වාණිජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු හරහා කර්මාන්තකරුවන්ට ණය නිකුත් කරනු ලැබුවද කර්මාන්තකරුවකුට ලබාදුන් ණය ප්‍රමාණය, ණය වාරිකය, පොලිය, ලැබිය යුතු ණය වාරිකය හා පොලී ශේෂය යනාදිය ගණනය කළ හැකි ක්‍රමයක් අරමුදල මඟින් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ සඳහා 2016 වර්ෂයේ දී ස්වයංක්‍රිය ණය පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.757,025 ක් හා 2017 වර්ෂයේ දී දත්ත ඇතුලත් කිරීමට, පුහුණු නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන රු.174,200 ක මුදලක් වැයකර තිබුණි. එම ව්‍යාපෘතිය අතර මඟ නවතා ඇති අතර ඒ

හේතුවෙන් නිශ්චිත දිනයකදී එක් එක් ණයකරුවන්ගෙන් ලැබිය යුතු මුදල නිවැරදිව හඳුනා ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. අර්ධ වාර්ෂිකව බැංකු වලින් ලැබෙන ණය වාරික හා පොලිය නිවැරදි යැයි උපකල්පනය කර ගිණුම්ගත කිරීම හැර සත්‍ය වශයෙන්ම ණයකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණයේ නිරවද්‍යතාවය ගණනය කිරීමේ හැකියාවක් අරමුදලට නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 කාර්ය මණ්ඩලය

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 391ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 314ක් විය. ඒ අනුව පුරප්පාඩු 78ක් හා එක් තනතුරක අතිරික්තයක් නිරීක්ෂණය විය. එනම් ජ්‍යෙෂ්ඨ, තෘතියක, ද්විතියික හා ප්‍රාථමික මට්ටම් වල පිළිවෙලින් 15, 02, 46 ක් හා 15ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි.

(ආ) අමාත්‍ය කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. අමාත්‍ය කාර්ය මණ්ඩලය සිටියදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා 2021 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් දක්වා එම නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.1,101,244ක් කාර්මික සංවර්ධන මණ්ඩලය ගෙවීම් සිදුකර තිබුණි.

එච්.එම්.යූ.එස්.ජේ.විජේකෝන්
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# පරිච්ඡේදය 04

## කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිත දර්ශක | දත්ත පදනම (තත්‍ය අගය 2020) | අපේක්ෂිත අගය 2021 | තත්‍ය අගය 31.12.2021 | පුරෝකථනය | | | 2021 අපේක්ෂිත අගයේ ප්‍රතිශතයක් (%) ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | |
| 1 | වාණිජ නිෂ්පාදනයේ යෙදෙන මුළු කර්මාන්ත ගණන - සමුච්චිත | 674 | 844 | 723 | 863 | 916 | 969 | 85.66 |
| 2. | වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන (කර්මාන්තපුර) | 68 | 55 | 72 | 140 | 53 | 53 | 130.91 |
| 3. | උත්පාදනය කරන ලද මුළු රැකියා ප්‍රමාණය - සමුච්චිත | 26,545 | 27,445 | 31,134 | 31,484 | 31,859 | 32,244 | 113.44 |
| 4 | උත්පාදනය කරන ලද නව රැකියා ප්‍රමාණය (කර්මාන්තපුර) | 109 | 2,400 | 2,474 | 3,398 | 3,798 | 4,183 | 103.08 |
| 5 | නිෂ්පාදන කර්මාන්තයන්හි ගුණාත්මකභාවය ඉහල නැංවීමට සඳහා පහසුකම් සැපයූ කර්මාන්ත ගණන (තත්ත්ව සහතිකරණයට) | 112 | 450 | 215 | 733 | 875 | 1,000 | 47.78 |
| 6 | නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා සපයන ලද පුහුණු අවස්ථා සංඛ්‍යාව (කුසලතා/ ධාරිතා / තාක්ෂණික) | 241 | 396 | 447 | 892 | 1,066 | 1,164 | 112.88 |
| 7 | මූල්‍ය පහසුකම් සපයන ලද කර්මාන්ත සහ ව්‍යවසායන් සංඛ්‍යාව (ණය යෝජනා ක්‍රම මඟින්) -සමුච්චිත | 3,170 | 3,400 | 3,331 | 3,453 | 3,763 | 4,128 | 97.97 |

# පරිච්ඡේදය 05

## තිරසර සංවර්ධන අරමුණු (SDG)

## සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / පරමාර්ථය | ඉලක්ක | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම (2021) | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| **ඉලක්ක 9: කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම් –** ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මිකකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යවත් කිරීම | 9.2 අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මිකකරණයක් ප්‍රවර්ධනය කිරීම හා කර්මාන්ත අංශය රැකියා ප්‍රමාණයට හා දළ ජාතික නිෂ්පාදනය දක්වන දායකත්වය 2030 වන විට අවම වශයෙන් 50% කින් වැඩි කිරීම. | 9.2.1 නිෂ්පාදන එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස | | | |
| | | • වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන (කර්මාන්ත පුර) | | | 130.91 |
| | | • තත්ත්ව වැඩිදියුණු කිරීම / තත්ත්ව සහතික කිරීම සඳහා සහාය වන නිෂ්පාදන කර්මාන්ත ගණන | 47.78 | | |
| | | 9.2.2 රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිෂ්පාදන රැකියා මුළු රැකියා ප්‍රමාණයේ අනුපාතයක් ලෙස | | | |
| | | • රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනනය කරන ලද නව රැකියා අවස්ථා ගණන (කර්මාන්තපුර) | | | 103.08 |
| | 9.3 විශේෂයෙන් දියුණු වන රටවල කුඩා පරිමාණයේ කර්මාන්ත හා ව්‍යාපාරවලට ලැබෙන මූල්‍ය පහසුකම් හා වෙළෙඳපොළ සඳහා ඇති ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීමත් එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම | 9.3.2 ණය හෝ ණය රේඛාව සහිත ප්‍රවර්ධනය කරන ලද කුඩා පරිමාණ කර්මාන්තවල අනුපාතය | | | |
| | | • ණය යෝජනා ක්‍රම මගින් මූල්‍යමය ආධාර ලබන කර්මාන්ත / ව්‍යවසායන් ගණන | | | 97.97 |

**5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

- තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ තොරතුරු ප්‍රතිශාත්මකව පරිච්ඡේද 5,1 හි ඉලක්ක 9.2 සහ 9.3 තුල දක්වා ඇත.

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 55 | 40 | 15 |
| තෘතියික | 05 | 03 | 02 |
| ද්විතියික | 489 | 504 | +15** |
| ප්‍රාථමික | 109 | 94 | 15 |

ඉහත වගුවෙහි සඳහන් පුරප්පාඩු පිරිවීමට කටයුතු කරන ලෙස වරින් වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ලිපි ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් අදාල නිලධාරීන් අනුයුක්ත කරනු ලැබේ.

## 6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

** නව සංවර්ධන නිලධාරීන් අමාත්‍යාංශය වෙත පත්වීම් ලබා පැමිණීම නිසාවෙන් අනුමත පිරිසට වඩා වැඩි සංවර්ධන නිලධාරීන් පිරිසක් සිටි. මෙම සංවර්ධන නිලධාරීන් අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

### දේශීය පුහුණු වැඩසටහන් - 2021

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1 | අභ්‍යන්තර විගණනය පිළිබඳ ඩිප්ලෝමාව 2021 | 1 | අවු.1 | 75,000.00 | මාර්ගගත ක්‍රමය ඔස්සේ | අභ්‍යන්තර විගණනය පිළිබඳ තවදුරටත් දැනුම වර්ධනය කරන ගැනීමට සහ නව ක්‍රමෝපායන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවීම. |
| 2 | උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණ සහ සංවර්ධන ශිල්පීය ක්‍රම | 1 | 8 | 30,500.00 | දේශීය | වෙබ් අඩවි නිර්මාණය සහ සංවර්ධනය කිරීමේ තාක්ෂණය ආදි සියලුම අංග අධ්‍යයනය කිරීමටත් වෙබ් යෙදුම් සඳහා හැකියාව වැඩි දියුණුවක මෙමගින් ලබා ගන්නා ලදී. |
| 3 | රජයේ වැටුප් ලේඛන පද්ධතිය | 2 | 3 | 10,000.00 | මාර්ගගත ක්‍රමය ඔස්සේ | රජයේ වැටුප් ලේඛන පද්ධතිය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකිවීම. |
| 4 | මාර්ගගතව පවත්වන සාකච්ඡා | 38 | 1 | 12,000.00 | දේශීය | මාර්ගගත ක්‍රමය ඔස්සේ සූම් තාක්ෂණය ආදිය භාවිතා කරමින් දුරස්ථ අධ්‍යාපනය, වැඩමුලු සාකච්ඡා ආදියට සහභාගී වීම සම්බන්ධව අවබෝධය ලබා දීම. |
| 5 | තොරතුරු තාක්ෂණ උපාංග පිළිබඳ පුහුණු වැඩසටහන | 50 | 1 | 12,000.00 | දේශීය | පරිගණක භාවිතයේ ඒ ආශ්‍රිතව ප්‍රයෝජනයට ගන්නා අමතර උපාංග පිළිබඳ දැනුම හා ඒවා භාවිතයේ දී ඇති වන සුළු සුළු දෝෂ අප විසින් ම සකසා ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී. |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 6 | ලිපිගොනුකරණය | 16 | 1 | 10,000.00 | දේශීය | රාජ්‍ය අංශය තුළ කාර්යක්ෂමතාවයෙන් හා කළමනාකාරිත්වයෙන් රාජකාරී කිරීම උදෙසා මනා ලිපිගොනුකරණයක ඇති අවශ්‍යතාව පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී. |
| 7 | රජයේ වැටුප් ලේඛන පද්ධතිය | 1 | 3 | 5,000.00 | මාර්ගගත ක්‍රමය ඔස්සේ | රජයේ වැටුප් ලේඛන පද්ධතිය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකිවීම. |
| 8 | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා පූර්ව ඇගයීම් පාදක කුසලතා සංවර්ධන වැඩසටහන (HRM) | 17 | 1 | 456,000.00 | දේශීය | තීරණ ගැනීම, කුසලතා වර්ධනය,ආකල්ප වෙනස් කර ගැනීම තුළින් පෞරුෂත්වය වර්ධනය කර සියලු අංශවලින් පරිපූර්ණ රාජ්‍ය නිලධාරීයෙකු බිහි කිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී. |
| 9 | සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය 2021/2022 | 1 | අවු. 1 | 172,500.00 | දේශීය | සේවා අවශ්‍යතා සපුරා ගැනීම. |
| 10 | කනිෂ්ඨ විධායකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (DEJE) | 1 | අවු.1 | 75,000.00 | දේශීය | රැකියා ස්ථානයේ රාජකාරී කටයුතු ඵලදායිතාවයෙන් හා කඩිනමින් ඉටු කර ගැනීමටත්, මහජන සම්බන්ධතා වර්ධනය කර ගැනීමටත් ඉංග්‍රීසි භාෂාව භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම |

## සෘජු විදේශ පුහුණු හා සංචාර - 2021

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | කාල සීමාව | | සමස්ථ ආයෝජනය දේශීය/විදේශීය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 1 | XXIV පීටර්ස්බර්ග් ජාත්‍යන්තර ආර්ථික සංසදය | 03 | 2021.06.02 | 2021.06.05 | US $ 11,950 + £ 150 | විදේශ | ගරු අමාත්‍යතුමා සහභාගී වූ සංචාර |
| 2 | තිරසාර කාර්මිකකරණය සඳහා කර්මාන්ත 4.0 වේගවත් කිරීම | 03 | 2021.11.08 | 2021.11.14 | 829,900.00 | විදේශ | ගරු අමාත්‍යතුමා සහභාගී වූ සංචාර |

## විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් විදේශ ශිෂ්‍යත්ව සහ සංචාර - 2021

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | කාල සීමාව | | සමස්ථ ආයෝජනය දේශීය/විදේශීය (රු) | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 1 | ජපාන රජයේ අනුග්‍රහය යටතේ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව 2020/2022 | 1 | 2021 | 2022 | Us$ 1200 | විදේශ | මානව සම්පත් සංවර්ධනය පිළිබඳව දැනුම ලබා ගැනීම |
| 2 | කාර්මික උද්‍යාන ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2021.11.24 | 2021.12.07 | | විදේශ මාර්ගගත ක්‍රමය | ශ්‍රී ලංකාව තුළ කාර්මික උද්‍යාන ගොඩනැගීම සඳහා දියුණු තාක්ෂනික දැනුම හා මෙවලම් භාවිතය පිලිබඳව අවබෝධයක් ලබා ගැනීම |
| 3 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඊ-වාණිජ්‍යය සහ සිල්ලර කර්මාන්තයේ සම්බන්ධීකරණ සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2021.12.07 | 2021.12.20 | | විදේශ මාර්ගගත ක්‍රමය | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඊ-වාණිජ්‍යයෙහි ඇති වැදගත්කමත් සිල්ලර කර්මාන්ත සඳහා ඊ-වාණිජ්‍යය යොදා ගැනීම පිළිබඳ දැනුම ලබා ගැනීම. |

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අදාල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අදාල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA– N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | රැස්වීම් 3ක් පවත්වා තිබේ. අනුකූල වේ | - | - |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | මේ වනවිට මු.රෙ. පරීක්ෂණ කිරීම සඳහා කමිටු පත්කර ඇත. |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | 2020 වර්ෂයේ ඉන්ධන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුනේ මෙම පරීක්ෂාව සිදු නොකරන ලදී. |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | අදාල නොවේ | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |